# ජල දියමන්ති විරුද්ධාභාසය

## Water - diamond paradox

මිනිස් ජීවිතයට අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් නොවන දියමන්ති ඉතා ඉහල වටිනාකමකින් යුක්ත වීමත් ජීවය සදහා අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් ජලය වටිනාකමින් අඩු වීමත් ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ water diamond paradox නමින් ප්‍රචලිත වූ ගැටලුවක් විය. නූතන ආර්ථික විද්‍යාවේ නිර්මාතෘ ලෙස සැලකෙන ඇඩම් ස්මිත් පවා මෙම ගැටලුවට නිවැරදි පිලිතුරක් සපයා නොතිබූ අතර ස්මිත්ට පසුකාලීන ඔස්ට්‍රියානු ජාතික ආර්ථික විද්‍යාඥයන් විසින් මෙම ගැටලුවට පිලිතුර නිවැරැදිව විග්‍රහ කර ඇත.



Image-Internet

ආර්ථික තීරණ ගනු ලබන්නේ සම්පූර්ණ ප්‍රතිලාභ මත නොව ආන්තික ප්‍රතිලාභ මත බව ඔස්ට්‍රියානු ආර්ථික විද්‍යාඥයන්ගේ මතය විය. පාරිභෝගිකයන් ලෝකයේ ඇති සියලුම දියමන්ති සහ මුලු ජල ප්‍රමාණයෙන් තමන්ට අවශ්‍ය දේ තෝරා ගන්නේ නැත. මිනිසුන් තෝරාගැනීම් කරනුයේ ඒකක වශයෙනි. මෙය ආන්තික උපයෝගීතාවය ලෙස හැදින්වේ. කාන්තාරයක තනිවූ මිනිසෙකුට දියමන්ති පිරුනු පසුම්බියක් සහ වතුර ගැලුමක් ලබාදුනහොත් ඔහු ජල ගැලුමට දියමන්ති වලට වඩා වැඩි වටිනාකමක් ලබාදෙයි. නමුත් සාමාන්‍ය පුද්ගලයෙකුට ජල ගැලුමක කිසිදු වටිනාකමක් නැතිවිය හැකිය. ජල ගැලුමක් ලබාගැනීමට වඩා දියමන්තියක් තමන් සතු කර ගැනීමෙන් මිනිසා තෘප්තියට පත්වෙයි. ලෝකයේ ජල සැපයුම විශාල නිසා එහි ආන්තික උපයෝගීතාවය අඩුය. මූලික අවශ්‍යතා සපුරාගැනීමට ප්‍රමාණවත් ජලය ඇත්නම් අමතර ඇති ජලය වැදගත් නොවන කාර්යයන් සදහා යොදා ගත හැකි නිසා අමතර ජල ඒකකයකට ලැබෙන වටිනාකම අඩුවේ. නමුත් දියමන්ති සැපයුම ඉතා අඩු නිසා එක් අමතර දියමන්තියක ප්‍රයෝජනය අමතර ජල ඒකකයකට බෙහෙවින් වැඩිවේ. මෙය ජීවය සදහා අත්‍යවශ්‍ය ජලය අභිබවා දියමන්ති සදහා වැඩි මිලක් නියම වීමට හේතුවේ

මේ හා සමාන ගැටලුවක් ලෙස පසුගිය කොවිඩ් සමයේ වෘත්තීයමය පාපන්දු ක්‍රීඩකයන්ගේ වෛද්‍ය වෘත්තිකයන්ගේ වැටුප් සංසන්දනය හැදින්විය හැකිය. වෛද්‍යවරුන්ගේ සේවය මානව සමාජයට ඉතා වටිනා වුවද පාපන්දු ක්‍රීඩාව සදහා ඇති ඉහල ජනප්‍රියත්වය පාපන්දු ක්‍රීඩකයන් වෛද්‍යවරුන්ට වඩා ඉහල වැටුප් ලබන පුද්ගලයන් බවට පත්කරයි.